# වාර්ෂික වාර්තාව

# 2012



## ලෝහෝර් ආර්යා ණය අරමුදල
## මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යංශය

# පටුන


| | | පිටුව |
|---|---|---|
| | සංස්ථාපිත තොරතුරු | 01 |
| | සභාපතිතුමියගේ පණිවුඩය | 02 |
| | පාලන භාරකාරතුමාගේ සමාලෝචනය | 03 |
| | දැක්ම , මෙහෙවර, අරමුණ | 04 |
| 01. | ඉතිහාසය | 05 |
| 02. | කාර්යභාරය | 05 |
| 03. | සංවිධාන ව්‍යුහය | 05 |
| 3.1 | භාරකාර මණ්ඩලය | 05 |
| 3.2 | සංවිධාන ව්‍යුහය | 06 |
| 3.3 | 2012 වසරේ ආයතනයේ කාර්යය මණ්ඩලය | 07 |
| 3.4 | 2012.12.31 දිනට කාර්යය මණ්ඩලය | 30 |
| 04. | 2012 වසරේ අරමුදලෙහි කාර්‍යසාධනය | 07 |
| 4.1 | ප්‍රතිලාභීන් හා සුදුසුකම් | 07 |
| 4.2 | ප්‍රතිලාභීන් | 07 |
| 4.3 | 2012 දැයට කිරුළ වැඩ සටහන - ප්‍රතිලාභින් | 08 |
| 4.4 | ණය ලබාදීමේ ප්‍රගතිය | 10 |
| 4.5 | ණය නිකුත් කිරිම හා ණය අයකර ගැනිම | 10 |
| 4.6 | අක්‍රීය ණය ගිණුම් කළමනාකරණයේ ප්‍රගතිය | 11 |
| 4.7 | පහසුකාරකයකු (Facilitator) වශයෙන් කටයුතු කිරීම | 12 |
| 05. | ලෝහෝර් ආර්යා ණය අරමුදල - කාර්යාල සංකීර්ණය | 12 |
| 5.1 | කුලී ආදායම. | 12 |
| 5.2 | කාර්යාල පරිශ්‍රය වැඩිදියුණු කිරිම හා අළුත්වැඩියාව | 13 |
| 06. | අරමුදලෙහි තිරසාරභාවය | 13 |
| 6.1 | මෙහෙයුම් ආදායම | 13 |
| 07. | සාමාන්‍ය පරිපාලනය හා මානව සම්පත් සංවර්ධනය | 14 |
| 7.1 | නව බඳවාගැනීම් /උසස්වීම් | 14 |
| 7.2 | විනය පරීක්ෂණ | 14 |
| 7.3 | කාර්යය මණ්ඩල පුහුණුව | 14 |
| 7.4 | කාර්යය මණ්ඩල සුභසාධනය / සුහද චාරිකාව -2012 | 14 |
| 7.5 | කාර්යය මණ්ඩල ණය | 14 |
| 7.6 | ආයතනයේ මෘදුකාංග පද්ධතිය වැඩිදියුණු කිරිම | 15 |
| 7.7 | වැඩිපුර අය වු මුදල් | 15 |
| 7.8 | ඇප බැඳුම්කර නිදහස් කිරිම | 15 |
| 7.9 | විගණන හා කළමනාකරණ කමිටුව | 15 |
| 08. | අනාගත සැලසුම් | 15 |
| 09. | ලෝහෝර් ආර්යා ණය අරමුදල සඳහා ස්වාධීන විගණක වාර්තාව | 16 |
| 10. | ආදායම් ප්‍රකාශය | 17 |
| 11. | ශේෂපත්‍රය | 18 |
| 12. | මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය | 19 |
| 13. | මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | 20-27 |
| 14. | බදුකරණය කිරීම | 28 |
| 15. | ලෝහෝර් ආර්යා ණය අරමුදල් කාර්යය මණ්ඩලය | 29 |

# සංස්ථාපිත තොරතුරු

| | | |
|---|---|---|
| **ආයතනයේ නම ලිපිනය** | ඃ | ලෝහෝර් ආර්යා ණය අරමුදල<br>100/ 3/2, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02. |
| **ලියාපදිංචිය** | ඃ | 1951 අංක 38 දරණ ලෝහෝර් ආර්යා ණය අරමුදල භාරකාර මණ්ඩල පනත ( 1953 සංශෝධිත ) යටතේ ස්ථාපිත මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යවස්ථාපිත ආයතනයකි. |

**භාරකාර මණ්ඩලය** ඃ

| | | |
|---|---|---|
| 1. | ගීතා කුමාරි විමලවීර මෙය | - සභාපතිනි, අධ්‍යක්‍ෂ<br>- ජාතික අයවැය දපාර්තමේන්තුව |
| 2. | නිමල් අබේසිරි මයා | - පාලන භාරකාර |
| 3. | ඩබ්.ඒ.ඩී.ඒ.ආර්.ගුණවර්ධන මයා | - සාමාජික |
| 4. | කේ.පී.සෝමසුන්දර මයා | - සාමාජික |
| 5. | කේ.ජේ.බී.ඒ. දිසානායක මයා | - සාමාජික |
| 6. | ප්‍රියානි පෙරේරා මෙය | - සාමාජික (අප්‍රේල් දක්වා) |
| 7. | ෂර්මිලා ගෝනවල මිය | - සාමාජික (අප්‍රේල් දක්වා) |

**විගණන කමිටුව**

| | | | |
|---|---|---|---|
| 1. | ටී. එන් ඔෂන් මහතා | - සභාපති, අධ්‍යක්ෂ<br>- රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව | |
| 2. | ඩබ්.ඒ.ඩී.ඒ.ආර්.ගුණවර්ධන මයා | - භාරකාර මණ්ඩල සාමාජික | |
| 3. | කේ.පී.සෝමසුන්දර මයා | - භාරකාර මණ්ඩල සාමාජික | 2012 මැයි |
| 4. | කේ.ජේ.බී.ඒ. දිසානායක මයා | - භාරකාර මණ්ඩල සාමාජික | |
| 5. | ප්‍රියානි පෙරේරා මෙය | - භාරකාර මණ්ඩල සාමාජික | 2012 අප්‍රේල් |
| 6. | ෂර්මිලා ගෝනවල මිය | - භාරකාර මණ්ඩල සාමාජික | |

**විගණක** :

**පෝජ් සහ සමාගම**
වරලත් ගණකාධිකාරින්
141/7, 2 වෙනි මහල,
වොක්සෝල් වීදිය,
කොළඹ 02.

**සේවාවන් ලබා ගන්නා බැංකුව** ඃ

මහජන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
කොළඹ 02.

## සභාපතිතුමියගේ පණිවුඩය

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය යටතේ සේවා සපයන රාජ්‍ය ආයතනයක් ලෙස ක්‍රියාත්මක වන ලෝහෝර් ආර්යා ණය අරමුදල ඵලදායි සහ කාර්යක්‍ෂම රාජ්‍ය සේවාවක් ගොඩනැගීම උදෙසා දායක වනු ලැබේ. එමගින් හදිසි අවස්ථා සහ ආපදාවන්හි දී රාජ්‍ය සේවකයින්ට සහනදායී පොළියක් මත කඩිනමින් කෙටි කාලීන ණය ලබා දීමෙන් ඔවුන්ගේ ජීවන තත්ත්වයේ ගුණාත්මක භාවය ඉහල නැංවීම සනාථ කරනු ඇත. 1951 දී ස්ථාපිත කරන ලද මෙම අරමුදල එදා සිට මූල්‍යමය වශයෙන් ශක්තිමත් චක්‍රීය අරමුදලක් ලෙස රාජ්‍ය සේවකයින් ණයගැති භාවයෙන් මුදවාලීමට සහන සලසා දෙමින් සාර්ථක අන්දමින් ක්‍රියාත්මක වේ.

2012 වසරේ මෙම අරමුදලේ කාර්යයභාරය සලකා බලන විට ප්‍රතිලාභීන් 4,358 කට රුපියල් මිලියන 173.9 පමණ කෙටි කාලීන ණය නිකුත් කිරිමට හැකි වි ඇත. ණය නිකුත් කීරිම දිස්ත්‍රික්ක අනුව සලකා බලන විට සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන අයුරින් ණය නිකුත් කිරිමට හැකි වු අතර සේවකයන්ගේ තනතුරු අනුව ගත් කළ සුළු සේවකයන් වැඩි දෙනෙක් සඳහා ණය නිකුත් කිරිමට කටයුතු කර ඇත. පසුගිය වසර හා සසඳන විට මෙහි ප්‍රගතියක් දැකිය හැක.

ලෝහෝර් ආර්යා ණය අරමුදල 2011.04.29 දින පොදු ව්‍යාපාර කාරක සභාව මගින් විමර්ෂණය කොට ලබා දුන් උපදෙස් ද ක්‍රියාත්මක කරමින් අක්‍රීය ණය අයකර ගැනිමේ ක්‍රියාවලිය ශක්තිමත් කර ඇත. ඒ අනුව 2012 වර්ෂය තුල අක්‍රීය ණය අයකර ගැනීම සඳහා වූ විශේෂ ක්‍රියා මාර්ග සාර්ථකව ක්‍රියාත්මක වීම තුලින් රුපියල් මිලියන 4 ක මුදලක් අරමුදල වෙත ලබා ගැනීමට හැකි වී ඇත.

මෙම ණය නිකුත් කිරීමේ සහ අයකර ගැනීමේ ක්‍රියාවලියට අයත් සියළුම මෙහෙයුම් වියදම් අරමුදලේ ලැබීම් තුලින් ආවරණය කිරීමෙන් පසු ශුද්ධ අතිරික්තය ලෙස රුපියල් මිලියන 21.5 ක් 2012 වසරේ අරමුදල තුල රඳවා ගැනීමට හැකියාව ලැබී ඇත.

මෙම ඉලක්ක සපුරා ගැනීමේ දී අපගේ කාර්යය මණ්ඩලය සහ භාරකාර මණ්ඩලය සැම විටම අප සමඟ විය. මෙම අරමුදල කාර්යක්ෂම හා ඵලදායී ලෙස පවත්වා ගෙන යාම තුලින් රාජ්‍ය සේවකයන්ගේ අවශ්‍යතා ඉටුකරමින් ඔවුන්ගේ සේවයේ ගුණාත්මකභාවය ඉහල දැමිම සදහා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු ප්‍රධානීන්ගෙන් ලද උපදේශ හා සහයෝගය සඳහා ස්තුතිය පිරිනමන අතර ඉදිරි කටයුතු සාර්ථක කර ගැනීම සඳහාද ඔවුන්ගේ මගපෙන්වීම ලැබෙනු ඇතැයි අපේක්ෂා කරමි. ඒ තුලින් ලෝහෝර් ආර්යා ණය අරමුදල රාජ්‍ය අංශයේ සේවකයින්ට මූල්‍ය පහසුකම් සලසන්නා ලෙස තවදුරටත් සාර්ථක අන්දමින් ඉදිරියේ දි කටයුතු කරනු ඇත.

සභාපතිනිය
ලෝහෝර් ආර්යා ණය අරමුදල

# පාලන භාරකාරතුමාගේ සමාලෝචනය

ස්කොට්ලන්ත ජාතික ජීන් ලෝහෝර් ආර්යාවගේ පෞද්ගලික ධන පරිත්‍යාගයෙන් හා එවකට පුණ්‍ය කොමසාරිස්ව සිටි ගරු නැතැනියල් දේවගැති තුමාගේ ප්‍රධානත්වයෙන් 1927 මාර්තු 26 දින ආරම්භ වු ලෝහෝර් ආර්යා ණය අරමුදල එදා සිට රජයෙන් සහ වෙනත් පරිත්‍යාගශීලීන්ගෙන් ලැබුනු ආධාර මත වර්ධනය වෙමින් දශක ගණනාවක් තිස්සේ සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී .

ආරම්භයේ පටන්ම අරමුදල තිරසාරව කළමනාකරණය කරගනිමින් රාජ්‍ය අංශයේ මෙන්ම අර්ධ රාජ්‍ය අංශයේ සේවකයින්ගේ යහපත සඳහා ණය අවශ්‍යතා සපුරාලමින් ක්‍රියාත්මක වන මෙම අරමුදල වර්තමානයේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අර්ධ රාජ්‍ය ආයතනයක් බවට පත් වි ඇත .

2012 වසරේ මා අරමුදලේ පාලන භාරකාර ධුරය භාරගන්නා විට අඩාලව තිබූ අභ්‍යන්තර පරිපාලනය විධිමත් කරමින් දිගු කාලීනව අක්‍රීයව තිබු ණය අයකර ගැනීමට විශේෂ ක්‍රියාමාර්ග අනුගමනය කිරීම තුලින් 2012 වර්ෂයේ රු. මිලියන 4 ක් අයකර ගැනීමට හැකිවීම විශේෂ ජයග්‍රහණයකි.

අතිගරු ජනාධිපති තුමාගේ මහින්ද චින්තන සංකල්පය යටතේ රාජ්‍ය ප්‍රතිපත්තීන් වලට අනුව රටේ සංවර්ධන වැඩපිළිවල සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරිම සඳහා පවත්වන දැයට කිරුළ ප්‍රදර්ශණ වැඩසටහනට සමගාමිව කටයුතු කරමින් හා දිවයිනේ දුෂ්කර පළාත් වල රාජ්‍ය සේවකයින් හට ණය පහසුකම් ලබා දෙමින් අරමුදලේ අරමුණු පුළුල් කිරීමට කටයුතු කරන ලදි.

ජපන් කළමනාකරණ ක්‍රම වේදයන්ට අනුව යමින් 5 S සංකල්පය මෙම ආයතනයේ ක්‍රියාවලියට හැකිතාක් ආදේශ කර ගනිමින් දශක ගණනාවක් තිස්සේ එකතු වී තිබු ලිපිගොනු විධිමත් පරිචයන්ට අනුව අපහරණය කර දෛනික කාර්යාල කටයුතු ක්‍රමවත්ව සහ පහසුවෙන් නිම කර ගැනීමට සුදුසු පරිසරයක් ස්ථාපිත කිරීමට කටයුතු කරන ලදි. එසේම, සේවක සුභසාධක කටයුතු වැඩිදියුණු කරමින්, සේව්‍ය සේවක දෙපාර්ශවය අතර ඉතා යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් ආයතනය තුල සහයෝගීතාවය වර්ධනය කර ගැනීම තුලින් ආයතනයේ ඉලක්කගත අරමුණු කරා ගමන් කිරිමට හැකිවීම මා ලැබු තවත් ජයග්‍රහණයකි.

තවද රාජ්‍ය භාෂා ප්‍රතිපත්තීන්ට ගරු කරමින් ආයතනයේ පරිහරණය කරන සියළුම අයදුම්පත්, ලිපි ලේඛන ත්‍රිත්වයෙන් මුද්‍රණය කර ලබා දීමට කටයුතු කරන ලදි. කාර්ය මණ්ඩලය ඒ සදහා පුරුදු පුහුණු කිරීමද කාලීණ අවශ්‍යතාවයන් අනුව ගන්නා ලද තවත් පියවරක් බව සඳහන් කරමි .

ඉහත අරමුණු සපුරා ගැනීමේදි භාරකාර මණ්ඩලයේ සභාපති තුමියගේ හා අනෙකුත් භාරකාර මණ්ඩල මහතුන්ගේද කාර්ය මණ්ඩලයේ හා මුදල් අමාත්‍යාංශයේ ලේකම් තුමා ඇතුළු අනෙකුත් නිලධාරීන්ගෙන්ද මා හට ලැබුණු සහයෝගය කෘතඥ පූර්වකව සිහිපත් කරමි.



පාලන භාරකාර
ඩබ්ලිව් නිමල් අබේසිරි
ලෝහෝර් ආර්යා ණය අරමුදල

# ලෝහෝර් ආර්යා ණය අරමුදල

**දැක්ම**

රාජ්‍ය අංශයේ සේවකයින්ට මූල්‍ය පහසුකම් සලසා දෙනු ලබන
ප්‍රධානතම ආයතනය ලෙස ක්‍රියා කිරීම.

**මෙහෙවර**

රාජ්‍ය සේවකයින් ණය බරින් මුදවා සතුටුදායක රාජ්‍ය සේවයක් නගාසිටුවීමට දායක වීම.

**අරමුණ**

රාජ්‍ය ආයතන, රාජ්‍ය සංස්ථා හා පළාත් පාලන ආයතන වල
සේවයේ නිරත සේවකයින්ට සහනශීලී පොලියක් යටතේ පහසු
කොන්දේසි මත කෙටි කාලීන ණය මුදල් කඩිනමින් ලබා දීම මගින්
ඔවුන් ණය බරින් මුදවා ගැනීම

## 1. ඉතිහාසය

මෙරට කලක් වාසය කල ස්කොට්ලන්ත ජාතික ජීන් ලෝහෝර් ආර්යාව විසින් ණය අරමුදලක් පිහිටුවීමට අවශ්‍ය මූලික ප්‍රාග්ධනය සඳහා පවුම් 300 ක මුදලක් පරිත්‍යාග කර තිබිණි. එවකට පුණ්‍ය කොමසාරිස්ව සිටි නැතැනියල් දේවගැතිතුමා අරමුදල පිහිටුවීමේ කාර්යයෙහි මූලිකව කටයුතු කර ඇති අතර එය 1927 මාර්තු 26 වන දින ලෝහෝර් ආර්යා ණය අරමුදල නමින් ආරම්භ කරන ලදී. එදා සිට මෙම අරමුදල ප්‍රතිලාභීන් වෙත ණය ප්‍රදානය කරමින් සහ ඒවා ආපසු අයකර ගනිමින් චක්‍රීය අරමුදලක් ලෙසින් ක්‍රියාත්මක වෙමින් පවතී. රාජ්‍ය අංශය මෙන්ම වෙළඳ සමාගම් වල සේවය කරන සේවකයින්ටද තමන්ගේ කෙටි කාලීන මුදල් අවශ්‍යතා සපුරා ගැනීමට එවකට පැවති බැංකු ක්‍රමයෙන් පිටුවහලක් නොලැබුන හෙයින් ඔවුන් අධික පොළියට ණය සපයන පුද්ගලයන්ගෙන් ණය ලබාගැනීමට පුරුදුව සිටියහ. මේ හේතුව නිසා රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේ සේවකයින්ද ණය බරින් පීඩනයට පත්විය. මෙවැනි පරිසරයක් තුල ලෝහෝර් ආර්යා ණය අරමුදල පිහිටුවීමෙන් පසු මෙම සේවකයින්ට ණය ලබා ගැනීමේදී ඉමහත් සහනයක් සැලසුනි. 1957 මෙම පනත ව්‍යවස්ථා ගතවීමත් සමගම අරමුදලට රජයෙන් මෙන්ම වෙනත් පරිත්‍යාගශීලීන්ගෙන් ද ලැබුන ආධාර උපයෝගී කරගෙන මෙම ආයතනයටම අයත් තෙමහල් ගොඩනැගිල්ල ඉදිකර ඇත.

## 2. කාර්‍යභාරය

- ණය අරමුදල තිරසාරව පවත්වා ගනිමින් ප්‍රතිලාභීන් සඳහා ණය ලබාදීම.
- මෙම අරමුදලින් ප්‍රතිලාභ ලබන රාජ්‍ය සේවකයින්ගේ යහපත සඳහා ආයතනමය ප්‍රවර්ධනය සහ ධාරිතාවය වැඩි කිරීම.
- ප්‍රතිලාභීන්ට ණය සැපයීම සඳහා අවශ්‍ය අරමුදල් සම්පාදනය සඳහා සුදුසු ප්‍රතිපත්ති සැකසීම.
- ණය කළමණාකරණය සඳහා යෝග්‍යවන ක්‍රමෝපායන් දියුණු කිරිම සහ ණය දීමේ පහසුකම් වැඩි දියුණු කිරිම.
- අනෙකුත් රාජ්‍ය ආයතන වල සේවකයින්ට ණය ලබාදීමේ දි තම අරමුදල් වලින් පහසුකාරකයකු වශයෙන් කටයුතු කිරීම.

## 3. සංවිධාන ව්‍යුහය

### 3.1 භාරකාර මණ්ඩලය

භාරකාර මණ්ඩලය රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ නියෝජිතයන්ගෙන් සමන්විත වේ. මෙම ආයතනයෙහි අනුශාසකධූරය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් හොබවන අතර, භාරකාර මණ්ඩලය සඳහා සාමාජිකයින් පත්කිරීම ඔහු හෝ ඇය විසින් සිදුකරනු ලැබේ. අරමුදලෙහි පරිපාලනය සඳහා අවශ්‍යවන, භාරකාර මණ්ඩලය විසින් නිකුත්කරනු ලබන නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා පාලන භාරකරුවකු පනතේ 10 වන හා 11 වන වගන්ති ප්‍රකාරව, භාරකාර මණ්ඩලය සඳහා පත් වූ අය අතරින් කෙනෙකු පත්කරනු ලැබේ. එම පනතෙහි 3.2 වගන්තියට අනුව භාරකාර මණ්ඩලයෙහි සභාපති තනතුර භාණ්ඩාගාර නියෝජිතවරයා වෙත පවරා ඇත.

## 3.2 සංවිධාන ව්‍යුහය




අරමුදලේ වැඩසටහන් සහ ක්‍රියාකාරකම් සංවිධානය කිරීම සහ ක්‍රියාත්මක කිරීම පරිපාලන සහ ගිණුම් යන ප්‍රධාන මෙහෙයුම් අංශ මගින් සිදු කරනු ලැබේ.

3.3 වගුව 01 - 2012 වසරේ ආයතනයේ කාර්යය මණ්ඩලය

| අනු අංකය | අනුමත තනතුර | අනුමත තනතුරු සංඛ්‍යාව | සත්‍ය සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | ගණකාධිකාරි | 01 | 01 |
| 2 | පරිපාලන නිළධාරි | 01 | 01 |
| 3 | ගිණුම් නිලධාරි | 01 | 01 |
| 4 | අභ්‍යන්තර විගණන නිලධාරි | 01 | 01 |
| 5 | කළමණාකරණ සහකාර | 35 | 32 |
| 6 | රියදුරු | 02 | 02 |
| 7 | කාර්යාල සහායක | 05 | 04 |
| 8 | ගොඩනැගිලි නඩත්තු සහායක | 01 | 01 |
| | **එකතුව** | **47** | **43** |

3.4 2012.12.31 දිනට කාර්ය මණ්ඩලය - (ඇමුණුම - 1)

## 4. 2012 වසරේ අරමුදලෙහි කාර්‍යසාධනය

### 4.1 ප්‍රතිලාභින් හා සුදුසුකම්

- විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය සේවාවේ නියුතු වසර 3 ක අවම ස්ථිර සේවා කාලයක් හිමි රාජ්‍ය සේවකයකු විම හෝ විශ්‍රාම වැටුප් රහිත අර්ධ රාජ්‍ය ආයතනයක සේවකයකු නම් වසර 5 ක අවම ස්ථිර සේවා කාලයක් සපුරා තිබිම.

- විශ්‍රාම ගන්නා වයස් සීමාවට පෙර ලබා දෙන ණය අයකර අවසන් කර ගැනීමට තරම් ප්‍රමාණවත් සේවා කාලයක් තිබිම.

- අයදුම්කරු සඳහා ඉහත සුදුසුකම් සහිත ඇපකරුවන් දෙදෙනෙකු ඉදිරිපත් කිරිම.

- අර්ධ රාජ්‍ය ආයතනයක සේවකයකු නම් ඇපකරුවන් දෙදෙනාගෙන් එක් අයකු අවම වශයෙන් වසර 03 ක ස්ථිර සේවා කාලයක් පවතින විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය සේවාවේ නියුතු අයෙකු වීම.

- මෙම දෙපාර්ශවයේම, එනම් රාජ්‍ය අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ අයදුම්කරුවන්ගෙන් මාසික වේතනයෙන් 40% සීමාව තුල ණය වාරිකය අයකර ගැනීමේ හැකියාව තිබිම.

### 4.2 ප්‍රතිලාභීන්

2012 වසරේදි රාජ්‍ය සේවයේ නියුතු 4,358 ක් මෙම අරමුදලෙන් ප්‍රතිලාභ ලබා ඇත. එම ප්‍රතිලාභින්ගෙන් 74% ක් කොළඹ දිස්ත්‍රික්කය තුල පවතින ආයතන අතර විසිරි සිටින සේවකයින්ට ලබා දීමට කටයුතු කලත් අනෙකුත් සියළුම දිස්ත්‍රික්කවල ආයතනවල සේවකයින්ද ආවරණය වන අයුරින් ණය ප්‍රතිලාභ ලබා දීමට හැකිවීම මෙම අරමුදලේ ජයග්‍රහනයකි (වගුව 2). එසේම, 3 වන වගුවේ සටහන්ව ඇති පරිදි මෙම ප්‍රතිලාභීන්ගෙන් වැඩි ප්‍රමාණයක් රාජ්‍ය සේවයේ සුළු සේවක කාර්යය මණ්ඩලයට අයත් සේවකයින් බව පැහැදිලි වී ඇත.

### වගුව 02 - 2011 - 2012 වර්ෂවල ණය ලබා ගත් රාජ්‍ය සේවක ප්‍රතිලාභීන් දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | |
|---|---|---|
| | 2011 | 2012 |
| කොළඹ | 3,403 | 3,245 |
| ගම්පහ | 398 | 288 |
| අනුරාධපුරය | 52 | 174 |
| මහනුවර | 94 | 143 |
| වව්නියාව | 196 | 77 |
| කළුතර | 96 | 64 |
| රත්නපුර | 46 | 59 |
| ගාල්ල | 60 | 55 |
| කුරුණෑගල | 65 | 46 |
| පුත්තලම | 06 | 44 |
| යාපනය | 84 | 43 |
| පොළොන්නරුව | 49 | 24 |
| ත්‍රිකුණාමලය | 91 | 20 |
| මුලතිව් | 14 | 15 |
| මන්නාරම | 30 | 10 |
| බදුල්ල | 01 | 10 |
| මාතලේ | 04 | 9 |
| හම්බන්තොට | 06 | 7 |
| කෑගල්ල | 41 | 06 |
| මඩකලපුව | 42 | 05 |
| අම්පාර | 02 | 05 |
| මොනරාගල | 06 | 04 |
| නුවරඑළිය | 02 | 03 |
| මාතර | 03 | 02 |
| **එකතුව** | **4,791** | **4,358** |

### 4.3 2012 - දැයට කිරුළ වැඩ සටහන - ප්‍රතිලාභීන්

රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුව රටේ සංවර්ධන වැඩපිළිවෙල සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීම උදෙසා වාර්ෂිකව පවත්වනු ලබන දැයට කිරුළ ප්‍රදර්ශණ වැඩසටහනට සමගාමීව කටයුතු කරමින් මෙම අරමුදලේ ප්‍රතිලාභ සියළුම දිස්ත්‍රික්ක වල රාජ්‍ය සේවකයින් සඳහා ලබා දීමේ අරමුණු පෙරදැරි කරගෙන කටයුතු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් 2012 වසරේදි අනුරාධපුර දිස්ත්‍රීක්කයේ පවත්වන ලද වැඩ සටහනට සමගාමීව එම ප්‍රදේශයේ රාජ්‍ය සේවයේ නියුතු සේවකයින් 108 දෙනෙක් සඳහා රු. මිලියන 5.23 ක ණය මුදල් ප්‍රදානය කිරීමට ක්‍රියා කරන ලදි.

වගුව 03 - 2012 හා 2011 වර්ෂවල ණය ලබාගත් රාජ්‍ය සේවක ප්‍රතිලාභීන් තනතුරු අනුව

| තනතුර | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | |
|---|---|---|
| | 2011 | 2012 |
| හමුදා සෙබළ | 898 | 503 |
| පොලිස් කොස්තාපල් | 758 | 545 |
| සාමාන්‍ය කම්කරු | 590 | 435 |
| කාර්යාල කාර්යය සහායක | 449 | 324 |
| පොලිස් සැරයන් | 427 | 294 |
| කළමනාකරණ සහකාර | 298 | 329 |
| කෝප්‍රල් | 203 | 916 |
| රියදුරු | 201 | 168 |
| පොලිස් පරීක්ෂක | 61 | 46 |
| උප පොලිස් පරීක්ෂක | 59 | 53 |
| අරක්කැමි | 56 | 41 |
| කොමිෂන් නොලත් නිලධාරි | 48 | 12 |
| පොලිස් ආරක්ෂක සහායක | 43 | 16 |
| සැරයන් | 42 | 95 |
| මැනුම් සහායක | 39 | 65 |
| බන්ධනාගාර නියාමක | 36 | 28 |
| මැනුම් ක්ෂේත්‍ර සහායක | 36 | 36 |
| භෝජනාගාර සේවක | 31 | 19 |
| සංවර්ධන සහකාර | 39 | 18 |
| උපස්ථායක | 24 | 20 |
| මුරකරු | 23 | 27 |
| මෝටර් කාර්මික | 23 | 10 |
| පොලිස් සිවිල් සහායක | 23 | 13 |
| තාක්ෂණ නිලධාරී | 21 | 15 |
| කාර්මික ශිල්පී | 21 | 12 |
| වඩු කාර්මික නිලධාරි | 21 | 22 |
| සෞඛ්‍ය පරිපාලක | 21 | 08 |
| මේජර් | 18 | 23 |
| මානව සම්පත් සහකාර | 18 | 08 |
| සුසානභූමි භාරකරු | 15 | 04 |
| ගිනිබටයන් | 14 | 08 |
| පරිපාලන නිලධාරි | 01 | 05 |
| පෙදරේරු | 13 | 12 |
| ගණකාධිකාරී | 08 | 11 |
| ලුතිනන් | 13 | 33 |
| ලෝහ කැටයම්කරු | 11 | 04 |
| පෙර පාසැල් ගුරු | 12 | 15 |
| තැපැල්කරු | 09 | 12 |
| පුස්තකාලාධිපති | 08 | 03 |
| ගබඩා සහායක | 06 | 06 |
| විදුලි කම්බිකරු | 08 | 13 |
| පුස්තකාල සහායක | 07 | 05 |
| බයිසිකල් පණිවිඩකරු | 06 | 19 |
| ඕවරසියර් | 10 | 08 |
| තැපැල් නිලධාරි | 05 | 18 |
| සහකාර අධ්‍යක්ෂක | 05 | 11 |
| පිළිගැනිමේ නිලධාරි | 05 | 02 |
| පොත් බැඳුම්කරු | 05 | 13 |
| වෙනත් | 103 | 55 |
| එකතුව | **4,791** | **4,358** |

## 4.4 ණය ලබාදීමේ ප්‍රගතිය

2012 වසරේ මැද භාගයේ සිට ලබා දෙන උපරිම ණය මුදල රු. 40,000 ක් වන අතර එම වසරේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුල නිකුත් කරනු ලැබූ ණය වර්ගවලට (ණය මුදල් සීමාවට) අනුව ලබාදුන් ණය වටිනාකම පහත වගුවෙන් දැක්වේ. ඒ අනුව, මෙම වර්ෂය තුල රාජ්‍ය සේවකයින් 4,358 දෙනෙකුට රුපියල් මිලියන 173.9 ක ණය මුදලක් නිකුත් කිරීමට හැකි විය.

**වගුව 04 - ණය මුදල් ලබා දීමේ ප්‍රගතිය**

| ණය වර්ගය රු. | නිකුත් කල ණය සංඛ්‍යාව | ණය මුදල් වටිනාකම (රු. 000) |
|---|---|---|
| 50,000 * | 1,730 | 86,500 |
| 40,000 | 1,116 | 44,640 |
| 30,000 | 1,319 | 39,570 |
| 20,000 | 107 | 2,140 |
| 15,000 | 52 | 780 |
| 10,000 | 34 | 340 |
| **එකතුව** | 4,358 | 173,970 |

*** 2012 අගෝස්තු මස දක්වා නිකුත් කරන ලදි.**

## 4.5 ණය නිකුත් කිරීම හා ණය අයකර ගැනීම

2009 හා 2012 වසර වලට අදාලව ණය මුදල් නිකුත් කිරීම හා අයකර ගැනීම පහත 5 වන වගුවෙන් හා ප්‍රස්තාරය 1 මගින් පෙන්නුම් කරයි. 2012 වර්ෂයේ ණය අයකර ගැනීමේ ප්‍රගතිය 2011 වර්ෂයට සාපේක්ෂව 6% ක වර්ධනයකි.

**වගුව 05 - 2009 සිට 2012 වසර දක්වා ණය නිකුත් කිරීම හා ණය අයකර ගැනීම**

| වර්ෂය | ණය සංඛ්‍යාව | ණය නිකුත් කිරීම (රු.000) | ණය අයකර ගැනීම (රු.000) |
|---|---|---|---|
| 2009 | 5364 | 156,190 | 188,438 |
| 2010 | 5943 | 170,065 | 211,855 |
| 2011 | 4791 | 193,645 | 215,221 |
| 2012 | 4358 | 173.970 | 228,064 |

**ප්‍රස්තාරය - 01**



වගුව - 06 - ණය නිකුත් කිරීම

| මාසය | නිකුත් කළ ණය අයදුම්පත් ප්‍රමාණය | භාරගත් ණය අයදුම්පත් ප්‍රමාණය | නිකුත් කල ණය සංඛ්‍යාව | ණය වටිනාකම (රු.) |
|---|---|---|---|---|
| ජනවාරි | 1200 | 297 | 312 | 13,205,000 |
| පෙබරවාරි | 937 | 327 | 278 | 11,670,000 |
| මාර්තු | 1074 | 450 | 379 | 15,560,000 |
| අප්‍රේල් | 675 | 340 | 337 | 13,830,000 |
| මැයි | 1136 | 338 | 362 | 14,805,000 |
| ජූනි | 1200 | 428 | 459 | 19,320,000 |
| ජූලි | 1190 | 316 | 441 | 17,080,000 |
| අගෝස්තු | 1150 | 508 | 397 | 15,700,000 |
| සැප්තැම්බර් | 1046 | 549 | 416 | 15,270,000 |
| ඔක්තෝබර් | 733 | 298 | 283 | 10,875,000 |
| නොවැම්බර් | 575 | 376 | 351 | 13,360,000 |
| දෙසැම්බර් | 543 | 301 | 243 | 13,295,000 |
| එකතුව | 11460 | 4528 | 4358 | 173,970,000 |

## 4.6 අක්‍රීය ණය ගිණුම් කළමනාකරණයේ ප්‍රගතිය

ණය අයකර ගැනීමේ සැලසුම සාර්ථකව ක්‍රියාත්මක කිරීම තුලින් අක්‍රීය වී තිබූ ණය ගිණුම් වලින් 2012 වසරේදී රුපියල් මිලියන 4 ක් අයකර ගැනීමට කටයුතු කරන ලදී. 2011 වසරේ පොදු ව්‍යාපාර කාරක සභාවේ නිර්දේශ පරිදි දශක ගණනාවක් තිස්සේ පැවති අක්‍රිය ණය අයකර ගැනිමට භාරකාර මණ්ඩල විශේෂ විධිවිධාන පනවන ලදි. එම අංශය සඳහා නවක නිලධාරීන් 7 දෙනකු සේවයේ යොදවන ලද අතර එම ප්‍රගතිය මාස 3කට වරක් රැස් වූ අක්‍රීය ණය අයකර ගැනිමේ කමිටුවේ දැඩි සුපරික්ෂණයට ලක් කරන ලදි. එසේම අයකර ගැනීමට හැකි සියළුම අක්‍රීය ණය අයකර අවසන් කිරීමටත් තවදුරටත් අයකර ගත නොහැකි ණය පිළිබඳව අවශ්‍ය නීතිමය කටයුතු කිරීමටත් සැලසුමක් සකස් කරන ලදි. එසේම එම සැලසුමට අනුව පහත ක්‍රියාමාර්ග අනුගමනය කරමින් පවති.

- අරමුදලේ වසර ගණනාවක් තිස්සේ ලේඛනාගාරය තුල පවතින ලියකියවිලි විගණනයකට ලක් කර එම ලිපිගොනු පරිගණක ගත කොට අපහරණය කිරීමට කටයුතු කිරීම.
- එසේ විගණනයට ලක් කරන ලද ලිපිගොනු පරිගණක දත්ත සමග සංසන්දනය කිරීම හා ලෙජරය අනුව පියවා දැමීම.
- ඉහත ක්‍රියාවලිය මාසිකව අධීක්ෂණයට ලක් කිරීම.
- අක්‍රීය ණය හඳුනා ගැනිමට හා ක්ෂණිකව වාරිකා ලබාගත නොහැකිව තිබූ පරිගනක පද්ධතිය කඩිනමින් යාවත්කාලින කිරීම.

වගුව 07 - අක්‍රීය ණය අය කර ගැනීමේ ප්‍රගතිය, 2011 - 2012

| මාසය | අයකරගත් මුදල (රු.) 2011 | අයකරගත් මුදල (රු.) 2012 |
|---|---|---|
| ජනවාරි | 466,400 | 342,173 |
| පෙබරවාරි | 447.392 | 242,125 |
| මාර්තු | 398,877 | 226,216 |
| අප්‍රේල් | 419,227 | 200,558 |
| මැයි | 463,222 | 350,829 |
| ජූනි | 673.907 | 469,817 |
| ජූලි | 387,561 | 571,007 |
| අගෝස්තු | 347,616 | 377,813 |
| සැප්තැම්බර් | 464,745 | 235,859 |
| ඔක්තෝම්බර් | 308.821 | 437,927 |
| නොවැම්බර් | 379,501 | 337,417 |
| දෙසැම්බර් | 259,157 | 256,456 |
| **එකතුව** | **5,016,426** | **4,048,197** |

## 4.7 පහසුකාරකයකු (Facilitator) වශයෙන් කටයුතු කිරීම

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම සහ පොල් සංවර්ධන අධිකාරියේ සේවකයින් සඳහා එම ආයතනයේ මුදල් භාවිතා කරමින් ණය ලබා දීමේ පහසුකම් සලසන්නෙකු ලෙස කටයුතු කරමින් සිටින අතර, 2012 වර්ෂය තුලදී එම සේවාව යටතේ එම ආයතන වල අයත් අරමුදල් භාවිතා කරමින් ලබාදුන් ණය ප්‍රමාණය පහත වගුවෙන් දැක්වේ.

වගුව 08 - ණය ලබා දීමේ පහසුකාරකයකු (Facilitator) වශයෙන් කටයුතු කිරීම

| ආයතනය | ණය සංඛ්‍යාව | ලබාදුන් ණය වටිනාකම (රු.) |
|---|---|---|
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම | 16 | 160,000/- |
| පොල් සංවර්ධන අධිකාරිය | 23 | 915,000/- |
| **එකතුව** | **39** | **1 075,000/-** |

## 05. ලෝහෝර් ආර්යා ණය අරමුදල - කාර්යාල සංකීර්ණය

### 5.1 කුලී ආදායම.

ලෝහෝර් ආර්යා ණය අරමුදලට වසර 99 ක දීර්ඝකාලීන බද්දක් මත රජයෙන් ලබාදී ඇති රූඩ් 01 ක භූමිභාගය තුල ඉදිකරන ලද තෙමහල් ගොඩනැගිල්ලක කාර්යාලය පවත්වාගෙන යනු ලබන අතර මෙම ගොඩනැගිල්ලේ අතිරික්ත ඉඩකඩ ප්‍රමාණය පහත සඳහන් ආයතන වලට කුලියට දී 2012 වර්ෂය තුල කුලී ආදායම වශයෙන් රුපියල් මිලියන 13 ක් උපයා ගන්නා ලදී.

වගුව 09 - 2012 - වසරේ ගොඩනැගිලි කුලී ආදායම

| අනු අංකය | ආයතනය | කුලියට සිටින මහල | වර්ග අඩි ප්‍රමාණය | ආදායම (රු.) |
|---|---|---|---|---|
| 01 | ලේක්හවුස් පොත්හල | බිම් මහල හා පතුල් මහල | 10,791 | **5,400,000** |
| 02 | සමූපකාර සේවක කොමිෂන් සභාව | 1 වන මහල | 2,415 | **1,593,570** |
| 03 | කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් | 1 වන මහල | 2,750 | **1,953,600** |
| 04 | ලංකා විදුලිබල මණ්ඩලය | 2 වන මහල | 4,700 | **3,356,928** |
| 05 | රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂම | 2 වන මහල | 840 | **600,000** |
| 06 | ඒ.ජේ.එස්. ඇසෝසියේටඩ් ආයතනය | අංකː 100/20 | 380 | **162,000** |
| | **එකතුව** | | **21,876** | **13,066,098** |

## 5.2 කාර්යාල පරිශ්‍රය වැඩිදියුණු කිරීම හා අලුත්වැඩියාව

ඉතා දිගු කාලයක් තිස්සේ නවීකරණය නොකරන ලද ලෝහෝර් ආර්යා අරමුදල් ගොඩනැගිල්ලේ පැවති අඩුපාඩු පරීක්ෂා කර නවීකරණය කිරීම සඳහා 2012 වසරේදී කොන්ත්‍රාත්කරුවකු ලියාපදිංචි කරගන්නා ලදී. ඒ අනුව එක් මහලක වැසිකිළි පද්ධතිය රු.478,213.00 ක වියදමක් දරා නවීකරණය කරන ලදී.

## 6 අරමුදලෙහි තිරසාරභාවය

අරමුදලේ මෙහෙයුම් සහ මූල්‍ය තිරසාරභාවය පවත්වා ගැනීම සම්බන්ධයෙන් භාරකාර මණ්ඩලයේ දැඩි අවධානය යොමුව ඇත. මෙම ආයතනය භාණ්ඩාගාරය මත යැපෙන ආයතනයක් නොවන අතර සේවක වැටුප් ඇතුලු සියළුම වියදම් මෙහි පොලී ආදායම තුලින් දරනු ලැබේ. පොලී ආදායම තුල මෙහෙයුම් චිරස්ථායී බව සහතික කරනු ලබන අතර, බොල්ණය, අනෙකුත් පරිපාලන වියදම් සහ ණය ආපසු අයකර ගැනීම සඳහා දැරීමට සිදුවන අනෙකුත් සියළුම වියදම් ද මෙම ආදායම තුල ආවරණය කරගැනිමෙන් අනතුරුව අරමුදලේ අතිරික්ත මුදල් මහජන බැංකුවේ පහත අයුරින් ආයෝජනය කර ඇත.

වගුව 10 - ආයෝජන

| ආයෝජන වර්ගය | බැංකුව | 2011/12/31 දිනට (රු). | 2012/12/31 දිනට (රු). |
|---|---|---|---|
| **ස්ථාවර තැන්පතු** | මහජන බැංකුව | 694,107 | 751,871 |
| **භාණ්ඩාගාර බිල්පත්** | ,, | 6,601,960 | 7,200,900 |
| **කෙටිකාලින ආයෝජන** | ,, | 33,027,437 | 66,434,649 |
| **එකතුව** | | **40,323,504** | **74,387,420** |

### 6.1 මෙහෙයුම් ආදායම

2012 වසර තුල දී මුළු මෙහෙයුම් ආදායම රුපියල් මිලියන 57 ක් වූ අතර ශුද්ධ මෙහෙයුම් අතිරික්තය රුපියල් මිලියනය 21.5 කි. 2011 වසරට සාපේක්ෂව රු. මිලියන 11 ක ඌණතාවයක් පෙන්නුම් කලද එයට හේතු වි ඇත්තේ 2010 වසරේ විගණන නිරීක්ෂණ පරිදි ගොඩනැගිල්ලේ හා ඉඩමේ වටිනාකම ප්‍රත්‍යාගණනය කොට ශේෂපත්‍රයට එකතු කිරීම හා ඒ සඳහා ගණනය කරන ලද වත්කම් ක්ෂය වටිනාකම රු.6,666,666 ක ඉහල අගයක් ගැනිමෙන් 2012 වාර්ෂික ක්ෂය අගය රු. 8,180,382.00 දක්වා වැඩි විමයි,

ප්‍රස්තාර 02 - මෙහෙයුම් අතිරික්තය 2009 -2012




## 7. සාමාන්‍ය පරිපාලනය හා මානව සම්පත් සංවර්ධනය

### 7.1 නව බඳවාගැනීම් /උසස්වීම්

- පුරප්පාඩුව පැවති කළමනාකරණ සහකාර 111 ශ්‍රේණියේ තනතුරු 05 ක් සඳහා නව නිළධාරීන් බඳවා ගන්නා ලදී.

### 7.2 විනය පරීක්ෂණ

චෝදනාවට ලක්ව වැඩ තහනම් වූ පරිපාලන නිලධාරිනිය සහ ගණකාධිකාරි සම්බන්ධයෙන් ස්වාධීන විනය පරීක්ෂණ නිලධාරියෙකු මගින් පැවැත්වූ විනය පරීක්ෂණ 2012.08.07 හා 2012.11.12 අවසන් කරන ලදී.

### 7.3 කාර්ය මණ්ඩල පුහුණුව

ආයතනයේ අනාගත දියුණුව සඳහා කාර්ය මණ්ඩලයේ දායකත්වය. අරමුදලේ සමස්ත සැලැස්මේ ඉලක්ක වලට අදාල කාර්ය සම්පාදන නිර්ණායක විමසා බැලීම, ණය කළමනාකරණය. කාර්යාල කටයුතු වල ඵලදායීතාවය දියුණු කිරීමට ඇති අවස්ථා විමසා බැලීම යන පරමාර්ථයන් පෙර දැරී කර ගනිමින් එක් දින පුහුණු වැඩමුළුවක් 2012.08.04 වන දින පුහුණුකරුවකුගේ ප්‍රධානත්වයෙන් අරමුදල් කාර්යාල පරිශ්‍රයේ දී පවත්වන ලදි.

### 7.4 කාර්ය මණ්ඩල සුභසාධනය / සුහද චාරිකාව -2012

ආයතනයේ අරමුණු හා ඉලක්කයන් සපුරා ගනිමින් මෙහි පාරිභෝගිකයන් වෙත උපරිම සේවාවක් සැලසීමට වර්ෂය පුරාම ඇප කැප වී සේවය කරන කාර්ය මණ්ඩලය තුල සුහදතාවය වර්ධනය කර ගැනීම හා විනෝද ආශ්වාදයක් ලබා දෙමින් කාර්ය මණ්ඩලයේ ඵලදායීතාවය ඉහළ දැමීම පෙර දැරී කර ගනිමින් 2012 දෙසැම්බර් මස 7,8,9 යන දින වල සුහද චාරිකාව සිදු කරන ලද අතර ඒ සඳහා කාර්ය මණ්ඩලයේ 44 දෙනකු සහභාගි විය.

### 7. 5 කාර්ය මණ්ඩල ණය

පහත සඳහන් ණය පහසුකම් 2012 වර්ෂය තුල සේවකයන්ට ලබා දෙන ලදි.

- රු.100,000/- ක උපරිමයට යටත් ආපදා ණය මුදල සේවකයින් 40 කට ලබා දීමට කටයුතු කරන ලදි.
- උත්සව අත්තිකාරම් රු. 5,000/- බැගින් සියළුම සේවකයින්ට ලබා දෙන ලදි.

එසේම වර්ෂ ගනණාවක් තුල නොපියව පැවති රු. 22,835/- ක සේවක ණය මුදල එහි හිමිකරුගේ තත්වය සොයා බැලීමෙන් අනතුරුව පොදු ව්‍යාපාර කාරක සභාවේ උපදෙස් පරිදි භාරකාර මණ්ඩලයේ අනුමැතිය සහිතව 2012.12.31 දින කපා හැරීමට කටයුතු කරන ලදි.

### 7.6 ආයතනයේ මෘදුකාංග පද්ධතිය වැඩිදියුණු කිරීම

අරමුදලේ පැවති මෘදුකාංග පද්ධතිය නඩත්තු කරන ලද සී/ස ගොල්ඩන් කී සමාගම බිඳ වැටීමත් සමග පද්ධතියේ ව්‍යාකූලතා රාශියක් මතු වී දෛනික කටයුතු වලට ඇති වූ බාධාවන් අරමුදලේ පාලන අධිකාරිය විසින් හඳුනා ගන්නා ලදි. ඒ අනුව මුදල් අමාත්‍යංශයේ දෙදෙනෙකුගෙන් යුත් කමිටුවක් මගින් මෘදුකාංග ව්‍යාපෘති ඇගයීමකින් ලබා දුන් උපදෙස් පරිදි අරමුදලට වඩාත් උචිත මෘදුකාංග පද්ධතියක් නිර්මානය කිරීමට පදනම්වන මෘදුකාංග අවශ්‍යතා පිරිවිතරය සකස් කිරීමේ කර්තව්‍ය මොරටුව විශ්ව විද්‍යාල පරිගණක අධ්‍යාපන ඒකකය වෙත භාරදීමට ක්‍රියා කරන ලදි.

### 7.7 වැඩිපුර අය වූ මුදල්

ප්‍රතිලාභින් සේවය කරන ආයතන විසින් ණය මුදල් වැඩිපුර කපා එවීම හේතුවෙන් ලෝහෝර් ආර්යා ණය අරමුදලට වැඩිපුර මුදල් ප්‍රමානයක් එක්රැස්ව තිබූ අතර එය ඉදිරියේදී එසේ සිදු නොවීමට අවශ්‍ය පියවර ගෙන හා උපරිමයෙන් එහි හිමිකරුවන්ට නැවත ලබා දීමට කටයුතු කරන ලදි. එසේම පොදු ව්‍යාපාර කාරක සභාවේ යෝජනාව පරිදි ඉතාමත් පැරණි ආපසු ලබා දීමට නොහැකිව තවදුරටත් ආයතනයේ ගිණුම් වල පැවති මුදල් 2012.12.31 දිනට ආයතනයේ ආදායමට බැර කිරීමට කටයුතු කරන ලදි.

### 7.8 ඇප බැඳුම්කර නිදහස් කිරීම

ඉඩම් උකස්කරයන් ඇපයට තබාගෙන ණය මුදල් නිකුත් කර තිබූ ඇප බැදුම්කර 1960 වසරේ සිට මෙම ආයතනයට වගකීමක්ව පැවති අතර එම ලියකියවිලි තව දුරටත් ආයතනයේ පරිහරණය සඳහා අවශ්‍ය නොවන බැවින් ඇප ඔප්පු 267 ක් විධිමත් කමිටුවක් මගින් විගණනය කර ඇප ඔප්පු 142 ක් නිත්‍යානුකූල අයිතිකරුවන් වෙත විධිමත් පරිදි භාර දීමට භාරකාර මණ්ඩලය විසින් අනුමැතිය ලබාදි ඇති අතර ඉන් 4 ක් මේ වන විටත් නිදහස් කරන ලදි.

**2012.12.31 දිනට අරමුදල සතුව පවතින ඇප ඔප්පු**

| | |
|---|---|
| මුළු ඇප ඔප්පු සංඛ්‍යාව | 267 |
| නිදහස් කිරීමට අනුමැතිය ලැබී ඇති සංඛ්‍යාව | 142 |
| තවදුරටත් සුරක්ෂිත කර ඇති | 91 |
| ගිණුම් පියවී අවසන් නොවී ඇති ඇප ඔප්පු | 30 |
| 2012.12.31 දිනට නිදහස් කර ඇති සංඛ්‍යාව | 4 |

### 7.9 විගණන හා කළමනාකරණ කමිටුව

2012 වසරේ විගණන හා කලමනාකරණ කමිටු රැස්වීම් 04 ක පැවත්වන ලද අතර මාස 3කට වරක් රැස්වීම් පැවත්වීමට කටයුතු කරන ලදි.

| අනු අංකය | කමිටු පැවත් වූ දින |
|---|---|
| 01 | 2012.03.22 |
| 02 | 2012.06.27 |
| 03 | 2012.08.10 |
| 04 | 2012.09.24 |

### 08. අනාගත සැලසුම්

- පොදු ව්‍යාපාර කාරක සභාවේ උපදෙස් පරිදි වර්ෂ ගණනාවක සිට පැවත එන අක්‍රීය ණය මුදල් හැකි අයුරින් අයකර ගැනීමට කටයුතු කිරීම හා තවදුරටත් අයකරගත නොහැකි මුදල් කපා හැරීම සඳහා අවශ්‍ය නීතිමය පියවර ගැනීම.

- ආයතනයේ කාර්ය භාරය කාර්යක්ෂමවත්ව ඵලදායිවත් කරගෙන යාම සඳහා අවශ්‍ය පරිගණක පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය පියවර දැනටමත් ගෙන ඇති අතර එහි කටයුතු 2013 වසර තුලදි නිම කිරීම.

- ආයතනය සතුව ඇති කාර්යාල පරිශ්‍රය අලුත්වැඩියාව හා වැඩිදියුණු කිරිම සඳහා මුදල් ආයෝජනය කිරිම. මේ සඳහා දැනට සැලසුමක් සකස් කරමින් පවතින අතර 2013 වසර අවසානයේදි එය ආරම්භ කිරිමට නියමිතය.

**පෝප් සහ සමාගම**
**(වරලත් ගණකාධිකාරින්)**

**නො.141/7, වොක්සෝල් වීදිය,**
**කොළඹ 02, ශ්‍රී ලංකා,**
**තැ.පෙ. : 119,**
**දු.ක. : +94 011 4710812, 2341737, 2541331**
**ෆැක්ස් : +94 011 2341737**
**ඊ-මේල් : popeco@sltnet.lk**

## 09 . ලෝහෝර් ආර්යා ණය අරමුදල සඳහා ස්වාධීන විගණක වාර්තාව

### 01. මූල්‍ය ප්‍රකාශන මත වාර්තාව

ලෝහෝර් ආර්යා ණය අරමුදලට අදාලව 2012 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය, ආදායම් ප්‍රකාශය සහ අරමුදල් ප්‍රවාහ ප්‍රකාශණය, අප විසින් විගණනය කරන ලද වැදගත් සංක්ෂිප්ත ගණකාධිකරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීම් සටහන් සහිත අදාල මූල්‍ය ප්‍රකාශය අප විසින් විගණනය කරන ලදි.

### 02. මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් කළමණාකරනයේ වගකීම.

ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රතිපත්තිවලට අදාලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ නිවැරදිව ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකිමයි. මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීම, ක්‍රියාත්මක කිරිම හා භෞතික වැරදිවලින් තොරව අදාල මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ නිවැරැදිව ඉදිරිපත් කිරීම සඳහා අභ්‍යන්තර පරිපාලනය පවත්වාගෙන යාම, වංචා සහ වැරදි වලින් තොරව, යෝග්‍ය ගණකාධිකරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීම, යුක්තිසහගත තත්වයේ ගණකාධිකරණ තක්සේරු යොදාගැනීම මෙම වගකීම්වලට අදාල වේ.

### 03. විගණනයේ පරමාර්ථය සහ මතයේ පදනම

අපගේ වගකීම වන්නේ මෙම මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් කරන ලද විගණනය පදනම් කරගෙන නිගමනයන් සවිස්තරව ලබා දීමයි. ශ්‍රී ලංකා විගණන ප්‍රතිපත්තිවලට අනුකූලව අප අපගේ විගණනය සිදුකරන ලදි. මූල්‍ය ප්‍රකාශණයන්ගේ නිවැරදිතාවය සාධාරණව අප විසින් සිදුකරන ලද විගණනය මගින් ලබාගැනීමට මෙම ප්‍රතිපත්ති අවශ්‍ය වේ.

විගණන පරීක්ෂණ පදනම මත සිදුකරන ලද අතර සාක්ෂි මගින් සනාථ කරන ලද වටිනාකම් මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර ඇත. එසේම මෙම විගණනයට උපයෝගි කරගෙන ඇති ගණකාධිකරණ මූලධර්ම තක්සේරු කිරීම සහ පරිපාලනය විසින් කරන ලද සැලකිය යුතු ඇස්තමේන්තු තක්සේරු කිරීම, මෙන්ම සමස්ත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම, අගය කිරීම මෙම විගණනයට ඇතුලත් කර ඇත.

අපගේ දැනගැනීමේ හා විශ්වාසයේ හැටියට විගණන කටයුතු සඳහා අවශ්‍ය සියලුම තොරතුරු හා පැහැදිලි කිරීම් ලබාගෙන ඇත. එම නිසා සාධාරණ පදනමක් මත කරන ලද විගණනයෙන් සුදුසු නිගමනයන් ලබා දී ඇතැයි අපි විශ්වාස කරමු.

### 04. මතය

අපගේ මතය අනුව, මෙතෙක් අපගේ පරීක්ෂාවෙන් පෙනී යන්නේ අරමුදල 2012 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා නිවැරදිව ගිණුම් වාර්තා සටහන් පවත්වා ගෙන ගොස් ඇති බව සහ 2012 දෙසැම්බර් 31 දිනට අරමුදලේ කටයුතු පිළිබඳ සත්‍ය හා සාධාරණ මතයක් මූල්‍ය ප්‍රකාශන මගින් ලබා දෙන බව සහ එම වර්ෂයේ ලාභය සහ මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්ට අනුකූල වන බවයි.

වරලත් ගණකාධිකාරින්,
කොළඹ 02.
